# ශ්‍රී ලංකාව මහජන ආරක්ෂාව තහවුරු කළ ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළ රටක්

## ජපාන විදේශ ඇමැති



**ක්‍රිසන්ති විතාරණ**

නාවික රටවල් ලෙස ජපානයට සහ ශ්‍රී ලංකාවට නිදහස් , විවෘත ඉන්දු- පැසිෆික් සංවර්ධනය සහ සෞභාග්‍යය අත්විඳිය හැකි බවත් කලාපය තුළ සාමය , සෞභාග්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා නාවික ආරක්ෂාව සඳහා සබඳතා ශක්තිමත් කිරීමත් වරාය සංවර්ධනය වැනි ගුණාත්මක යටිතල පහසුකම් ව්‍යාපෘති මගින් ජපානය ශ්‍රී ලංකාව සමග එක්ව කටයුතු කිරීමට තීරණය කර ඇති බවත් ජපාන විදේශ ඇමැති ටරෝ කොනො මහතා පවසයි.

ජපාන විදේශ ඇමැතිවරයා මේ බව පැවසුවේ ඊයේ(4) ශ්‍රී ලංකාවේ නිල සංචාරය අරඹමිනි.

**★ ජපාන විදේශ ඇමැතිවරයෙක් 2003 වසරෙන් පසු එනම් වසර 15 කට පසු ශ්‍රී ලංකාවේ සංචාරය කරන්නේ මොන වගේ අරමුණකින් ද?**

ආසියාව , මැද පෙරදිග සහ අප්‍රිකාව සම්බන්ධ කරන මුහුදු මාර්ගයේ ඉතා වැදගත් ස්ථානයක පිහිටා තිබෙන ශ්‍රී ලංකාව භූ දේශපාලන සහ උපාය මාර්ගික වශයෙන් ඉතා වැදගත් රටක්. ඒ වගේම මෑත වසර කිහිපය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ ඉහළ ආර්ථික වර්ධනයක් පෙන්නුම් කළ රටක්. එම නිසා ද්විපාර්ශවීය සබඳතා තව දුරටත් තර කිරීමේ අදහසින් 2018 වසරේ මගේ පළමු සංචාරය ලෙස ශ්‍රී ලංකාව තෝරා ගනු ලැබුවා.

සාමය හා සෞභාග්‍යය සහතික කිරීම සඳහා නිදහස් හා විවෘත උපාය මාර්ගය ප්‍රවර්ධනය කිරීම සඳහා නීතියේ ආධිපත්‍යය මත පදනම් වන නිදහස් හා ජාත්‍යන්තර මධ්‍යස්ථානය ලෙස ඉන්දු පැසිෆික් කලාපය ජපානය සලකනවා.

මගේ සංචාරය අතරතුර සෞඛ්‍යය සහ පරිසර යන ක්ෂේත්‍රවල සබඳතා ශක්තිමත් කරන්නේ කෙසේ ද යන්නත් ජාතික සංහිඳියා ක්‍රියාවලියට සහය ලබා දීම පිළිබඳවත් සාකච්ඡා කරනවා. ඒ වගේම උතුරු කොරියාවේ ගැටලුව ඇතුළු කලාපීය සහ ජාත්‍යන්තර තත්ත්වයන් පිළිබඳවත් සාකච්ඡා කරනවා. එසේම මෙම සංචාරය ජපානය සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවීය සබඳතා තව දුරටත් වැඩි දියුණු වෙනු ඇති බවට මම විශ්වාස කරනවා.

**★ ජපානය සහ ශ්‍රී ලංකාව අතර වත්මන් ද්විපාර්ශවීය සබඳතා ඔබ අගය කරන්නේ කෙසේද?**

ජපානය සහ ශ්‍රී ලංකාව අතර මිත්‍ර සබඳතා ආරම්භ වන්නේ එවකට මුදල් ඇමැතිවරයා වූ ජේ. ආර් ජයවර්ධන මහතා (පසුව ජනාධිපතිවරයා ලෙස සේවය කළ) 1951 දී සැන් ෆ්‍රැන්සිස්කෝ සාම සමුළුවේ දී ජපානයේ ස්වාධීන හිමිකම් වෙනුවෙන් සිදු කළ කතාවත් සමගයි.

දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ජාත්‍යන්තර ප්‍රජාව තුළ ජපානයට නැවත නැගී සිටීමට සහය වූ එම කතාව ජපන් ජාතිකයින්ට තවමත් මතකයි. එතැන් පටන් දෙරටම මිත්‍රශීලී සහ සහයෝගී මාර්ගයේ ගමන් කළා. අද දක්වා ශ්‍රී ලංකාවේ සමාජීය සහ ආර්ථික යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජපානය දායකත්වය ලබා දුන්නා. යෙන් ට්‍රිලියන් 1කට( රුපියල් ට්‍රිලියන 1.35 කට ආසන්න) වැඩි ණය මුදලක්, යෙන් බිලියන 200 කට ( ආසන්න රුපියල් බිලියන 200 කට ආසන්න) ආසන්න ප්‍රතිපාදන අරමුදල්, යෙන් බිලියන 80 කට (රුපියල් බිලියන 108කට ආසන්න) තාක්ෂණික සහයෝගිතාව සහ 1,000 කට වැඩි ජපාන සහයෝගිතා ස්වේච්ඡා සේවකයින් මිට ඇතුළත්. ඊට අමතරව ශ්‍රී ලංකාවේ සාමය ගොඩ නැගීම සඳහා ජපානය ක්‍රියාකාරීව සහය ලබා දුන්නා.

වසර 20 කට පසු ජපාන අගමැතිවරයකු ශ්‍රී ලංකාවේ සංචාරය කරමින් ජපාන අගමැති ෂින්සො අබේ මහතා 2014 වසරේ සැප්තැම්බර් මාසයේ දී සහ 2016 මැයි මාසයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහ 2017 අප්‍රියෙල් මාසයේ දී අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ ජපාන සංචාරවලදී සබඳතා පුළුල් කරමින් ගත් තීරණ අනුව පසුගිය වසර කිහිපය තුළ වෙළෙඳ සහ ආයෝජන, නාවික අංශයන් හී සබඳතා වර්ධනය වුණා. ජනතාව හුවමාරු කිරීම වැනි විවිධ ක්ෂේත්‍ර තුළ ද්විපර්ශවීය සබඳතා වැඩි දියුණු කෙරුණා.

එසේම බෞද්ධ සංස්කෘතියක් සහිත ජාතීන් දෙකක් ලෙස දෙරට ජනතාවගේ සමානතා රැසක් පැවතීමත් දෙරටේම ජනතාව දෙරටේ සංචාරය කිරීමට මාර්ගයක් වුණා. ජපානය මෙන්ම ශ්‍රී ලංකාව මෙම සබඳතා පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබා දී තිබෙනවා.

**★ ශ්‍රී ලංකාව තුළ ජපාන ආයෝජන අපේක්ෂාව කොපමණ ද?**

ජපානය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සබඳතා ශ්‍රී ලංකාවේ වසර 30ක යුද්ධය අවසානය වීමත් සමග තව තවත් ලං වුණා. මේ වන විට ජපානය සහ ශ්‍රී ලංකාව වැදගත් ආර්ථික සහ වෙළෙඳ සහකරුවන්. වාර්ෂික ද්විපාර්ශවීය වෙළෙඳාම ජපන් යෙන් බිලියන 100 (රුපියල් බිලියන 170 ක් පමණ) ඉක්මවනවා. ඒ වගේම ජපාන සමාගම් 130 කට වැඩි සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ තිබෙනවා.

ශ්‍රී ලංකාවේ වරාය සංවර්ධනය වැනි යටිතල සංවර්ධන ව්‍යාපෘති ඉන්දු- පැසිෆික් කලාපයේ සබඳතා වර්ධනය කිරීමට උපකාරී වෙනවා. ජපානය නිරන්තරයෙන්ම ජාත්‍යන්තර තත්ත්වයේ යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනවා.

ඒ වගේම ශ්‍රී ලංකාව ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක්. විශේෂයෙන් 2009 දී අර්බුදකාරී වාතාවරණය නිම වීමෙන් පසු සංචාරක ආකර්ෂණය වැඩි වී තිබෙනවා. මෑත වසර කිහිපය තුළ වසරකට 40,000 කට වැඩි ප්‍රමාණයකින් ජපාන සංචාරකයින් ගේ පැමිණීම වැඩි වී තිබෙනවා. ශ්‍රී ලංකාව ආයෝජනයට විශ්වාසවන්ත රටක් ලෙස මම විශ්වාස කරනවා.

ජපාන වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ 100 කට ආසන්න ව්‍යාපාරික නියෝජිත පිරිසක් මෙම මාසයේ දී ශ්‍රී ලංකාවට පැමිණෙනවා. ශ්‍රී ලංකාව තුළ විවිධ ක්ෂේත්‍රයන් හි ජපාන ආයෝජන ඉහළ යනු ඇති.

**★ උතුරු කොරියාවේ වත්මන් තත්ත්වය ජපානයට බලපාන්නේ කෙසේද? සාමය ඇති කිරීම වෙනුවෙන් ඔබ ගෙන ඇති පියවර මොනවාද?**

පසුගිය වසර දෙක පුරා උතුරු කොරියාව න්‍යෂ්ටික අත්හදා බැලීම් තුනක් සිදු කළා. ඒ වගේම බැලිස්ටික් මිසයිල 40 ක් දියත් කළා. ඉන් දෙකක් ජපානයට ඉහළින් ගමන් කළා වගේම ඉන් එකක් අයි.සී.බී.එම්. පරාසයේ එකක්. උතුරු කොරියාවේ න්‍යෂ්ටික හා මිසයිල අත්හදා බැලීම් ජපානයට, ශ්‍රී ලංකාවට පමණක් නොවෙයි ජාත්‍යන්තර ප්‍රජාවටම තර්ජනයක්.

දෙවැනි ලෝක යුද්ධය අවසාන වීමෙන් පසු වසර 70ක් පුරා පැසිෆික් රටක් ලෙස ආසියානු පැසිෆික් කලාපයේ සාමය හා සෞභාග්‍යය වෙනුවෙන් ජපානය නිරන්තරයෙන් සහය ලබා දුන්නා. මෙම ගැටලුව සාමකාමීව විසඳ ගැනීමට කැමති රටවල් අතර ජපානය සිටිනවා.